**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2021 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

**හැඳින්වීම:**

**ව්‍යාපාර පරිසරය විෂය ක්ෂේත්‍රයේ සියලුම කොටස් ආවරණය කරමින් මෙම ප්‍රශ්න පත්‍රය පිළියෙල කර තිබූ අතර එහි අරමුණ වූයේ මෙම විෂය ක්ෂේත්‍රය සමබන්ධයෙන් අයදුම්කරුවන්ගේ සමස්ථ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමයි. සමස්ථයක් ලෙස ගත්කළ අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනත් සමහරක් අයදුම්කරුවන් හොඳින් පිළිතුරු සැපයිමට අපොහොසත් විය.**

පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම කොටස මගින් විෂයට අදාල කරුණු වලින් බොහොමයක් ආවරණය කරන ලදී. මෙම ප්‍රශ්නය සඳහා සියලුම අයදුම්කරුවන් පිළිතුරු සැපයීමට ඉදිරිපත් වී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40 ක් වෙන්කර තිබූ අතර, අයදුම්කරුවන්ගෙන් බහුතරය, සාර්ථකව ලකුණු ලබා ගැනීමට සමත් විය. කෙසේ වෙතත්, ප්‍රශ්න අංක **1.8, 1.9, 1.12, 1.17** සහ **1.20** සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි නොවන පිළිතුරු සපයා ඇති බව දක්නට ලැබුණි. එම නිරීක්ෂණයන් පහත පරිදි වේ:

**1.8** මෙම ප්‍රශ්නය මගින් තත්කාලීන දළ පියවීම් පද්ධතියක සහභාගීකරුවන් පිළිබඳව විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන්, නිවැරදි පිළිතුර වන සේවක භාරකාර අරමුදල වෙනුවට සේවක අර්ථසාධක අරමුදල යන පිළිතුර දක්වා තිබුණි.

**1.9** මෙම ප්‍රශ්නය මගින් සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය නොවන ලියවිල්ල පිළිබඳව විමසා තිබුණි. කෙසේ වෙතත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි පිළිතුර වන පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ වෙනුවට ‘‘සාංගමික ව්‍යවස්ථාවලිය” තෝරා තිබුණි.

**1.12** ‘‘සීමාසහිත පොදු සමාගමක සිටිය හැකි උපරිම කොටස් හිමියන් ගණන 50 කි” යන මෙම ප්‍රකාශය සත්‍යද අසත්‍ය ද යන්න දැක්විය යුතු විය. මෙම ප්‍රකාශය ‘‘අසත්‍ය” වුවත් බහුතරයක් එය "සත්‍ය"යැයි දක්වා තිබුණි.

**1.17** ‘‘තිරසාර පරිසරය” යන්නෙහි තේරුම පැහැදිලි කිරීම අවශ්‍ය විය. නවීන සංකල්පයක් වූ මේ සම්බන්ධව බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් විය.

**1.20** චෙක්පතක මූලිකාංග 2 ක් සඳහන් කිරීම අවශ්‍ය විය. මූලිකාංග වෙනුවට ඇතැම් අයදුම්කරුවන් චෙක්පතක පාර්ශවයන් දක්වා තිබුණි.

මෙම ප්‍රශ්න කිහිපය හැරුණුකොට අනෙකුත් ප්‍රශ්න සඳහා බහුතරයක් අයදුම්කරුවන් හොඳින් පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය සතුටුදායක විය.

## B - කොටස

### ප්‍රශ්න අංක 02

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත විය. එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු 10 බැගින් වෙන්කර තිබුණි. මෙම ප්‍රශ්නය ''ව්‍යාපාර සඳහා අවශ්‍යවන උපකාරක සේවා" මත පදනම් විය.

(a) මුදලේ කාර්යයන් පිළිබඳ පරීක්ෂාකර තිබුණි. අයදුම්කරුවන් සියලුදෙනාම පාහේ මෙම **(a) කොටස** සඳහා සාර්ථකව පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය. තවත් සමහරක් මුදලේ ලක්‍ෂණ පිළිබඳව දක්වා තිබුණි.

(b) රක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම පරීක්‍ෂාකරන ලදී. එම වචනය බහුතරයක් නිවැරදිව තේරුම්ගෙන තිබුණේ නැත. ඇතැම් අයදුම්කරුවන් රක්‍ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශවයන් පිළිබඳව විස්තර කර තිබුණි. මෙය ඉතාමත් සරළ ප්‍රශ්නයක් වුවත්, රක්‍ෂණ මූලධර්ම නිවැරදිව සටහන් කිරීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් විය.

(c) ව්‍යපාර සංවිධානයකට රක්‍ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුම පරීක්‍ෂාකර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ජීවිත රක්‍ෂණය පිළිබඳ පමණක් කරුණු දක්වා තිබුණි. තවත් සමහරක්, විස්තර නොකර කරුණු වශයෙන් පමණක් දක්වා තිබුණි. එබැවින් ලකුණුවලින් කොටසක් පමණක් ලබා ගැනීමට සමත් විය. අවදානම අඩුකර ගත හැකි බව,සේවකයින්ගේ සුභසාධනයට හේතු වීම, ව්‍යාපාරයකට ණය ලබා ගැනීමේ හැකියාව වැඩි වීම යනාදී රක්‍ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ ඔවුන් දැනුවත්ව නොසිටියහ.

### ප්‍රශ්න අංක 03

මෙමගින් බෙදාහැරීම් මාර්ග සහ ගෝලීය ව්‍යාපාරික පරිසරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂා කිරීම අරමුණ විය.

(a) නිසි පරිදි කළමනාකරණය නොවූ බෙදාහැරීම් මාර්ගයක අවාසි සඳහන් කිරීම,මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කෙරිණ. බහුතරයක් අයදුම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය දැනුම භාවිතා කර පිළිතුරු සපයා තිබුණි. වැඩි දෙනෙක් මුළු ලකුණු ලබාගැනීමට සමත් විය.

(b) හොඳ බෙදාහැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු සාධක පදනම්ව මෙම ප්‍රශ්නය පිළියෙල කර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දක්වා නොතිබුණි. සමහරක් ඔවුන්ගේ සාමාන්‍ය දැනුම භාවිතාකර පිළිතුරු ලිවීමට උත්සාහ කළද අදාල නොමැති පිළිතුරු ද බහුලව දක්වා තිබුණි. කෙසේ වෙතත් සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය.

(c) ව්‍යාපාරයක් එහි මෙහෙයුම් ගෝලීය වශයෙන් ව්‍යාප්ත කළ යුත්තේ ඇයි දැයි යන්න පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්‍ෂා කර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් කිසිඳු පැහැදිලි කිරීමකින් තොරව හේතු පමණක් දක්වා තිබුණි. එබැවින් මෙම කොටස සඳහා මුළු ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් අසමත් විය. එසේම, තවත් සමහරක් අයදුම්කරුවන්ට ගෝලීය ව්‍යාපාරික පරිසරය පිළිබඳව කිසිඳු අවබෝධයක් නොමැති වීම නිසා එමගින් නව වෙළඳපොළවල් සොයා ගත හැකිය, යන්න පමණක් දක්වා තිබුණි.

සමස්ථයක් ලෙස ගත්කළ මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක වූ අතර බහුතරයක් අයදුම්කරුවන් සතුටුදායක ලෙස ලකුණු ලබා ගත්හ.

## ප්‍රශ්න අංක **04**

(a) ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්‍ෂා කර තිබුණි. ව්‍යවසායකයෙකුගේ ලක්‍ෂණ සඳහන් කිරීම, මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. අයදුම්කරුවන් සියලුදෙනාම පාහේ ව්‍යවසායකයෙකුගේ ලක්‍ෂණ නිවැරදිව දක්වා මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය.

(b) බහුතරයක් අයදුම්කරුවන්, ව්‍යවසායකත්වය ශ්‍රී ලාංකීය ආර්ථිකයට වැදගත් වන්නේ ඇයිදැයි යන්න නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදිව හේතු දක්වා තිබුණද ඒවා පැහැදිලි කර නොතිබුණු නිසා අඩු ලකුණු ලබාගත්හ. එම කරුණු පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයේ දක්වා තිබුණි.

කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවති අතර බහුතරයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබා ගැනීමට සමත් විය.

## ප්‍රශ්න අංක **05**

පරිසර දූෂණය වැළැක්වීි සඳහා ක්‍රියාමාර්ග, ව්‍යපාරයක ඇල්මැති පාර්ශවයන්, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් මුහුණ දෙන අභියෝග යනාදිය ඇතුළත් ව්‍යාපාරික පරිසරය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

**(a)** දෙන ලද සිද්ධියට අදාලව ඇල්මැති පාර්ශව පිළිබඳ දැනුම, මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය.

**(b)** ආයුර්වේද රෝහලක් පවත්වාගෙන යාමේදී පරිසර දූෂණය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මත මෙම කොටස පදනම් වී තිබුණි. දී ඇති සිද්ධිය පදනම් කරගෙන මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර සැපයීමට සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් අසමත් විය. කෙසේ නමුත්, පරිසර දූෂණය වැළැක්වීමට ගත හැකි සාමාන්‍ය ක්‍රියාමාර්ග දක්වා තිබුණද, මුළු ලකුණු ලබා ගැනීමට එම පිළිතුරු ප්‍රමාණවත් නොවීය.

**(c)** මෙම කොටසින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන අභියෝග පිළිබඳ විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් ව්‍යාපාර පිළිබඳ දැනුම භාවිතා නොකර සාමාන්‍ය දැනුම භාවිතාකර මේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට යොමුවී තිබුණි. තවද, අධික බදු පැනවීම / සහභාගීත්වය අඩුබව / රජයෙන් සපයන් උදව් අඩු බව / දේශපාලන වාතාවරණය වැනි අදාල නොවන පිළිතුරු ද සපයා තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය එතරම් සාර්ථක නොවීය.

## <u>C - කොටස</u>

### ප්‍රශ්න අංක 06

**Refresh සමාගමට** අදාල සිද්ධි අධ්‍යයනයක් පදනම් වූ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය මගින් විද්‍යුත් වාණිජය / ප්‍රවාහනය සහ ERP පද්ධති යනාදිය පිදිබඳ දැනුම දෙන ලද ප්‍රශ්නයට අදාලව විමසා තිබුණි. අපේ නිරීක්ෂණයන්ට අනුව සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඉදිරිපත්ව තිබුණු අතර සතුටුදායකව ලකුණු ලබා ගැනීමට සමත් විය.

**(a)** දෙන ලද ව්‍යාපාර එහි මෙහෙයුම් සඳහා විද්‍යුත් වාණිජ්‍ය යොදා ගන්නා ආකාරය පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. බහුතරයක් අයදුම්කරුවන් **Refresh සමාගම** විද්‍යුත් වාණිජ්‍යය භාවිතා කරන ආකාරය නිවැරදිව සඳහන් කළද නිවැරදිව පැහැදිලි කර නොතිබුණි. එබැවින් ඔවුන්ගේ බහුතරයකට මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි විය. නමුත්, ඔවුන්ගෙන් සමහරක් ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන නොතිබුණි. එබැවින්, ව්‍යාපාර සංවිධානයන්ට ලැබෙන වාසි වැනි පිළිතුරු දක්වා තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නයෙන් කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් පිළිබඳව දැනුම පරීක්ෂා කරන ලදී. මෙහිදී කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් පැවැතීමෙන් **Refresh සමාගමට** ලබාගත හැකි වාසි සඳහන් කළ යුතු විය. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් මේ සඳහා පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගැනිමට සමත් විය.

**(c)** මෙම ප්‍රශ්නයෙන් හොඳ ප්‍රවාහන පද්ධතියක ගුණාංග පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරය මේ සඳහා නිවැරදි පිළිතුර සපයා මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය.

**(d)** මෙම කොටස මගින් මුදල් භාවිතයට සාපේක්ෂව චෙක්පත් භාවිතයේ ඇති වාසි පිළිබඳව විමසා තිබුණි. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් මුළු ලකුණු ලබා ගත්හ. ඇතැම් අයදුම්කරුවන් එකම කරුණ නැවත නැවතත් ලියූ නමුත් ලකුණු ලබා ගැනීමට අසමත් විය.

**(e)** මෙම කොටස මගින් **Refresh සමාගමට** භාවිතා කළ හැකි විද්‍යුත් සන්නිවේදන පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂා කරන ලදී. සිද්ධිය කෙරෙහි අවධානය යොමු නොකර බහුතරයක් සිසුන් සාමාන්‍ය දැනුම භාවිතයෙන් පිළිතුරු සපයා තිබූ නමුත් ඔවුන්ද මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(10) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(11) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

\- * * * -